**01.** පීරිස්ගේ ව්‍යාපාරයේ 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ සේවක වැටුප් පිළිබඳ තොරතුරු ඔබට සපයා ඇත.

ගෙවූ සේව්‍ය EPF - රු. 92 250

ගෙවූ සේව්‍ය ETF - රු. 30 750

සේව්‍ය හා සේවක EPF දායකත්වය 15% ක් හා 10% කි. සේව්‍ය ETF දායකත්වය 5% කි. ව්‍යාපාරය සේවකයින්ට වැටුප් ගෙවා ඇති අතර සේවක EPF දායකත්වය අඩුකර ගෙන සේවක අර්ථසාධක අරමුදලට ඒය නිසි පරිදි ගෙවා ඇත . සේව්‍යයාගේ EPF දායකත්වය සහ ETF දායකත්වය ගෙවා ඇත්තේ මාස 9 ක් පමණි. අතිකාල දීමනා රු. 9 000 ක් වේ.

2021 මාර්තු 31 න් අවසන් වර්ෂයේ සේවකයින්ට අදාල මුළු වියදම කොපමන ද ?............................................

**02.** සී/ස අනූෂා සමාගමේ 2021 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා තොරතුරු පහත දැක්වේ.

| සේවකයා | වැටුප වාර්ෂික ) |
|---|---|
| නිමල් ................. | රු. 300 00 ( දළ ) |
| සිරියදාස.............. | රු. 360 000 ( ශුද්ධ ) |
| පියසෝම.............. | රු. 400 000 ( දළ ) |
| අනුරාධ ................. | රු. 540 000 ( ශුද්ධ ) |

මෙම සමාගමේ සේව්‍ය හා සේවක EPF දායකත්වය 15% ක් හා 10% කි. සේව්‍ය ETF දායකත්වය 3% කි. සමාගම සේව්‍ය හා සේවක EPF දායකත්වය හරි අඩකු වර්ෂය තුල ගෙවා ඇති අතර මෙතෙක් සේව්‍ය ETF දායකත්වය ගෙවා නොමැත .

A. සී/ස අනූෂා සමාගමේ සේවකයින් සම්බන්ධ මුළු වියදම කොපමන ද ? ........................................................
B. සී/ස අනූෂා සමාගමේ සේවකයින් සම්බන්ධ මුළු EPF වගකීම කොපමන ද ? ................................................

**03.** අරලිය ව්‍යාපාරය විසින් සහල් නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි. ව්‍යාපාරයේ 2020 /04 /01 දින ගබඩාවේ ඇති වී තොග ඒකක 4 800 Kg කි. ඒහි වටිනාකම රු. 134 400 කි. 2020 / 2021 කාලච්චේදයේ දී වී මෙට්‍රික් ටොන් 40 ක් මිලදී ගන්නා ලදී. ඒහි වී 1 Kg මිල රු. 30 කි. සාමාන්‍යයෙන් වී 10 Kg කින් සහල් 8 Kg නිෂ්පාදනය කරයි. 2020 ඔක්තොබර් මාසය තුලදී වී 2 000 Kg ක් නිෂ්පාදනයට යොදාගත් අතර නිෂ්පාදනය කිරීමට හැකි වූයේ සහල් 1 500 Kg පමණි. 2021 / 03 / 31 දිනට ඉතිරි වී තොගය 4 500 Kg කි. ව්‍යාපාරය FIFO ක්‍රමයට තොග නිකුත් කරයි. ව්‍යාපාරය පිරිවැය මත 25% ක දළ ලාභයක් සහිතව භාණ්ඩ විකුණනු ලබයි. ව්‍යාපාරය තුල නිමි සහල් තොග නොමැත. ව්‍යාපාරයේ අනෙකුත් නිෂ්පාදන පිරිවැය රු. 83 600 කි. 2020 / 2021 වර්ෂයේ ව්‍යාපාරයේ සහල් නිෂ්පාදනයේ ආදායම කොපමන ද ? (මෙට්‍රික් ටොන් - 01 ක් 1000 Kg ක් වේ ) .....................................................................................

JM Learning "your virtual learning partner" Suranga Sampath

**04.** පහත සඳහන් වැරදි අතුරින් අවිනිස්චිත ගිණුමක් විවෘත වීමට බලපාන ගනුදෙනුව වන්නේ ,

a) රු. 4 500 ක ලද වට්ටම් දුන් වට්ටම් ගිණුමට හර කර ඇත.
b) ණයගැති පාලන ගිණුමේ හර පැත්ත රු. 3 000 ක් අඩුවෙන් ඒකතු කර ඇත.
c) ආපසු ඒවුම් ජර්නලයේ ඒකතුව රු. 4 000 ක් අඩුය.
d) ශේෂ පිරික්ෂුමේ සඳහන් නොවූ ණයපොලී වියදම රු. 7 000 කි. ......................................................

**05.** සී/ස මානෙල් පොදු සමාගමේ ගිණුම් පුහුණු වන්නෙකු විසින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති අතර ඔහු ගණනය කර ඇති ලාභය රු. 120 000 කි. පසුව සිදුකරන ලද පරීක්ෂාවේ දී වැරදි හෙළිදරව් වී ඇත.

- රු . 20 000 ක ගැනුම් ඉන්වොයිසියක් මූල්‍ය ගිණුම්වල දෙවරක් සටහන් වී ඇත.
- රු. 2 000 ක පරිපාලන වියදම් ශේෂ පිරික්ෂුම තුල සටහන් වී නොමැත
- විකුණුම් ගිණුමේ හර පැත්ත රු. 2 000 ක් අඩුවෙන් සටහන් කර ඇත.
- රු. 2 700 ක ආයෝජන ආදායම ගිණුම් වලින් මඟ හැරී ඇත .

සමාගමේ ,

a) අවිනිස්චිත ගිණුමේ ආරම්භක ශේෂය ,
b) සමාගමේ නිවරදි ලාභය ගණනය කරන්න

**06.** පහත සඳහක් වැරදි සමඟි මරණාධාර සමිතියේ සිදුව ඇත. වැරදි සමඟ ගණනය කල සමුච්චිත අරමුදල රු. 960 000 කි .

- සමිතිය පවත්වාගෙන යන ගොඩනැගිල්ල සංවර්ධනයට ලබා දුන් රු. 10 000 ක පරිත්‍යාගයක් ආදායමක් ලෙස හඳුනාගෙන ඇත.
- සමිතිය චාරිකා තුනක් යාමට රු. 150 000 ක් ( ඒකකට රු. 50 000 බැගින් ) රැස්කරගන්නා ලදී. ඒය ආදායම් ලෙස වසර තුල හඳුනාගෙන ඇත. සමිතිය වසරතුල චාරිකා දෙකක් පමණක් ගොස් ඇති අතර ඉතිරි චාරිකාව ඊළඟ වර්ෂය තුල යාමට නියමිතය.
- 2020 / 04 /01 දින ඉදිරියට ලද හා සාමාජික මුදල් පිළිවෙළින් රු. 3 000 ක් හා රු. 2 500 ක් විය. වර්ෂය තුල සාමාජික මුදල් රු. 28 000 ක් ලැබුණි. 2021.03.31 දිනට හිඟ සාමාජික මුදල් රු. 1 600 කි. සමිතිය මුදල් පදනම මත ආදායම හඳුනාගෙන ඇත.

ඔබ විසින් නිවරදි සමුච්චිත අරමුදල ගණනය කරන්න.

**07.** පහත තොරතුරු ළහිරු ක්‍රීඩා සමාජයට අදාල වේ,

2020.04.01 දිනට සමුච්චිත අරමුදල රු. 2 200 000

2021.03.31 න් අවසන් වර්ෂය සඳහා ආදායම රු. 800 000

2021.03.31 න් අවසන් වර්ෂය සඳහා වියදම රු. 500 000

ක්‍රීඩාපිටිය ඉදිකිරීම අරමුදලට ලද පරිත්‍යාග රු. 5 000 0000

2021.03.31 න් අවසන් වර්ෂය තුලදී ක්‍රීඩාපිටිය ඉදිකිරීම සඳහා දරන ලද වටිනාකම රු. අදාල අරමුදලින් රු. 1 500 000 කි.

ඔබ විසින් ක්‍රීඩා සමාජයේ 2021.03.31 දිනට සමුච්චිත අරමුදල ගණනය කරන්න.........................................

**08.** සීමාසහිත රණසිංහ පොදු සමාගමේ ගිණුම් විගණන යේදී පපහත වැරදි අනාවරණය විය.

a) රු. 50 000 ණයට විකුණුම් වෙළඳ ලැබිය යුතු පාලන ගිණුමේ මේ බැර පැත්තේ රුපියල් 500 ක් ලෙස සටහන් කිරීම.
b) ආපසු යැවුම් ජර්නලය එකතුව රුපියල් 2 000 කින් අඩුය.

c) රුපියල් 4000 දුරකථන වියදම ශේෂ පිරික්සුමට නොගැනීම.

d) රුපියල් 6 000 ක ණයට ගැනුම් වෙළඳ ලෙවිය යුතු පාලන ගිණුමේ සටහන් නොවීම

මෙම සමාගමේ ඉහත හේතු තුළින් ශේෂ පිරික්සුම අසමාන වීම නිසා අවිනිශ්චිත ගිණුමක් විවෘත කරන ලදී . ඉහත වැරදි වලින් මෙම සමාගමේ ශේෂ පිරික්සුමට වන බලපෑම අඩුවීමේ හෝ වැඩිවීමේ වටිනාකම සඳහන් කරන්න. ..............................

**09.** සීමාසහිත වන රණමයුර පොදු සමාගමේ 2021 . 03.31 දිනට අඩමාණ ණය වෙන් කිරීම රුපියල් 5 000 වැඩියෙන් ගිණුම් වල සටහන් වී ඇත. අවසාන වෙන ලැබිය යුතු ශේෂය මත 10% ක් අඩමාන ණය වෙන්කිරීම් සමාගමේ ප්‍රතිපත්තිය වේ. 2020 . 03 .31 දිනට අඩමාන ණය වෙන් කිරීමේ ගිණුමේ ශේෂය රු. 15 000 කි. එමෙන්ම 2021 .03.31 අවසාන වසරේ ගණනය කර තිබූ මුළු විස්තීරණ ආදායම රු. 180 000 කි. සමාගමේ 2021 .03.31 දිනට නිවැරදිව වෙළඳ ලැබිය යුතු ධාරණ අගය හා නිවැරදි ලාභය ගණනය කරන්න . ......................................................................

**10.** සීමාසහිත බාලසූරිය සමාගමේ 2021 .03.31 දිනට පිළියල කරන ලද ශේෂ පිරික්සුම තුලනය නොවූ නිසා අවිනිශ්චිත ගිණුමක් විවෘත කරන ලදී . ගිණුම් විමර්ශනයේදී පහත වැරදි අනාවරණය විය

- වෙලද ලැබිය යුතු දෑ වලින් රු. 20 000 වෙළඳ ගෙවිය යුතු ගිණුමට හර කර ඇත. මෙය මුදල් පොතේ නිවැරැදිව සටහන් කර ඇත.
- ශේෂ පිරික්සුම එකතු කරන විට ශේෂ පිරික්සුමේ හර පැත්ත රු. 2 000 අඩුවෙන් එකතු කර ඇත.
- රු. 2 000 හානිකරන අලාභ කපා හැරීම වෙළඳ ලැබිය යුතු දෑ ලෙජරයේ වෙළෙඳ ලැබිය යුතු පෞද්ගලික ගිණුමේ සටහන් වී ඇත
- රු. 8000 රක්ෂණ වියදම් අදාළ ගිණුම් දෙකටම බැර කර ඇත .

ඉහත වැරදි හේතුවෙන් සමාගමේ ශේෂ පිරික්ෂුමට ඇතිවූ බලපෑම ගණනය කරන්න.......................................

**11.** රාමනායක ව්‍යාපාරය වැරදි නිවැරදි කළ පසු 2021 .03.31 දිනෙන් අවසන් වර්ෂයේ ලාභය රු. 31,000 විය . පහත වැරදි ව්‍යාපාරය තුළ සිදුවී ඇත.

- 2021 /03/31 දින තිබූ තොගය හානි විය. එහි අගය රු. 68,000 කි. එහි තිබූ සුන්බුන් විකුණා රු. 10 000 ලබාගැනීමට හැකි විය. රක්ෂණ වන්දි රු. 50 000 ක් ලබා දීමට එකඟ වී ඇති අතර අවසන් තොගය ලෙස, පිරිවැය මූල්‍ය ප්‍රකාශ තුලට ඇතුලත් කර ඇත.
- 2020.04.01 දින රු. 90 000 ක් වැයකර ලී බඩු ගත් අතර එය ලී බඩු අළුත්වැඩියා ලෙස වාර්තා කර ඇත.
- ව්‍යාපාරයේ දේපල පිරියත උපකරණ 10% බැගින් කරන ක්ෂය කරන නමුත් වැරදීමකින් සියයට 5% බැගින් සේ කර ඇත.ක්ෂය කර ඇති ප්‍රමාණය රු. 42 000 කි.
- VAT ඇතුලත් කර රු. 95 200 ක විකුණුම් ඉන්වොයිසියක් සම්පූර්ණයෙන් පොත්වලින් මඟ හැරී ඇත.
- හානිකරන අලාභ සඳහා වෙන් කිරීම් වසර අග ණයගැතියන්ගෙන් 5% කි.

ඉදිකිරීමට පෙර ගණනය කර තිබූ ශුද්ධ ලාභය හෝ අලාභය ගණනය කරන්න ....................................

**12.** අකලංකගේ නිෂ්පාදන ව්‍යාපාරයේ 2021.03.31 දිනෙන් අවසන් වසරේ ගිණුම් සහකරු විසින් ගණනය කරන ලද නිෂ්පාදන පිරිවැය රු. 270 000 කි. එහෙත් වර්ෂය අවසානය වන විට නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේදී පහත වැරදි සිදුවී ඇති බව අනාවරණය විය .

- අවසාන අමුද්‍රව්‍ය තොගය රු. 10 000 අධිතක්සේරු වී ඇත
- රුපියල් විසි දාහක යන්ත්‍ර ක්ෂය වෙනත් සෘජු වියදම් යටතේ දක්වා ඇත.
- කාර්යාලයට අයත් වූ රු. 10 000 ක විදුලි වියදම් ද ඇතුළත් මුළු විදුලි වියදම් වන රු.40 000 පොදු කාර්ය වියදම් යටතේ දක්වා ඇත.

JMC Learning
"your virtual learning partner"

- නිමි ද්‍රව්‍ය ගෙනයාමේ වියදම් රුපියල් විසිදාහ නිෂ්පාදක පොදුකාර්ය වියදම් යටතේ දක්වා ඇත .මෙය ආදායම් ප්‍රකාශනයේ දක්වා නොමැත.

a) ඉහත වැරදි නිවැරදි කිරීමෙන් පසු නිවැරදි නිෂ්පාදන පිරිවැය කොපමණද ? ....................................................

b) රු. 270 000 නිෂ්පාදන පිරිවැය ඇතුලත් කර ගණනය කරන ලද ලාභය රු. 300 000 නම් නිවැරදි ලාභය කොපමණද ? ...................................................................................................................................

**13.** සංතුස් නිෂ්පාදන සමාගමේ 2020 /04/01 දිනට අමුද්‍රව්‍ය තොග රු. 76 000 කි. ඒහි ද්‍රව්‍ය ඒකක 1250 ක් ඇතුළත්ය.

පළමු මාස 6 තුළ ඒකකයක් රු. 62 ක බැගින් මිලදී ගෙන ඇත. අවසාන මාස හය තුළ ඒකකයක් රු. 60 බැගින් ඒකක 1000 ක් මිලදී ගෙන ඇත. ගමබඩාව FIFO ක්‍රමයට තොග නිකුත් කරයි .

නිමි භාණ්ඩ ඒකක නිපදවීමට අමුද්‍රව්‍ය ඒකක 2.5 ක් වැය වේ .

කම්මල විසින් ව්‍යාපාරයකට වසර තුළ නිමි භාණ්ඩ ඒකක 1300ක් යවා ඇත. කම්මල තුළ ආරම්භක හා අවසාන නොනිමි තොග නොතිබූ අතර කම්මල් පොදුකාර්ය පිරිවැය රු.86 000 කි. ඍජු ශ්‍රම පිරිවැය රු. 52 000 කි . ඒකකයක් වෙනුවෙන් දරන ලද පොදුකායී වියදම රුපියල් අටකි.

2026 03:31 දින අවසන් වර්ෂයේ ව්‍යාපාරය නිෂ්පාදන පිරිවැය කොපමන ද ? ....................................................

**14.** කමල්ගේ ව්‍යාපාරයේ 2021.03.31 දිනට තොග අයිතම් තුනක් සම්බන්ධයෙන් ඔබට තොරතුරු සපයා ඇත.

| අයිතමය | පිරිවැය රු. | අපේක්ෂිත විකුණුම් මිල රු. | අපේක්ෂිත විකුණුම් වියදම් රු. |
|---|---|---|---|
| X | 15 000 | 18 000 | 8 000 |
| Y | 12 000 | 15 000 | 1 500 |
| W | 20 000 | 22 000 | 5 000 |

X,Y සහ W යන අයිතම තුනටම අපේක්ෂිත නිම නිම කිරීමේ වියදම ලෙස රුපියල් 500 බැගින් වෙන වෙනම වැයවේ . අයිතම් ක්‍රමය යටතේ 2021. 03.31 දිනට තොගයේ වටිනාකම කොපමණ ද ? .............................................................

**15.** උපයෝගී පොතන කාර්යභාරය පමණක් ඉටුකරන පොත් ඇතුළත් කාණ්ඩය තෝරන්න

a) මුදල් පොත , සුලු මුදල් පොත , බැංකු ගිණුම

b) ලැබීම් ජර්නලය , ගෙවීම් ජර්නලය , සුළු මුදල් පොත

c) ගැනුම් ජර්නලය , විකුණුම් ජනලය , බැංකු ගිණුම්

d) මුදල් පොත, බැංකු ගිණුම , ගෙවීම් ජර්නලය

e) ලැබීම් ජර්නලය, ගෙවීම් ජර්නලය , ගැනුම් ජර්නලය

**16.** බැංකු ගිනුමේ සංශෝධිත ශේෂය රු. 30 000

- බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් රු.5 000
- උපලබ්ධි නොවූ තැන්පතු රු. 2 000
- බැංකු ගිණුමේ නැති ලාභාංශ හා පොලී රු. 3 000

A. බැංකු ගිනුමේ සංශෝධනයට පෙර තිබූ ශේෂය කුමක් ද ?

1) රු. 36 0000
2) රු. 39 000
3) රු. 33 000
4) රු. 38 000

5) රු. 34 000

B. බැංකු විස්තරේ දැක්වෙන ශේෂය කුමක් ද ?

1) රු. 34 000
2) රු. 39 000
3) රු. 33 000
4) රු. 38 000
5) රු. 36 000

**17.** ලක්මාල් විසින් 2020 .04.01 දින රුපියල් ලක්ෂ 10ක් යොදා ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී . ව්‍යාපාරයේ 2021.03.31 දිනට වගකීම් ලෙස රු. 400 000 පැවතුණි. 2021 . 03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ ලක්මාල් තම පවුල් පෞද්ගලික මුදලින් රු.160 000 ව්‍යාපාරයෙ විදුලි බිල් ගෙවීමට භාවිතා කර ඇත. 2021.03.31 දිනයෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපාරයේ ලාභය රු.360 000 ක් වූ රු. 200 000 මුදලක් සිය පෞද්ගලික ප්‍රයෝජනයට රැගෙන ගොස් ඇත . 2021.03.31 දිනට ව්‍යාපාරයේ පැවති වත්කම් කොපමණ ද ?

1) රු. 1 720 000 කි.
2) රු. 1 600 000 කි.
3) රු. 1 800 000කි.
4) රු. 1 900 000 කි.
5) රු. 1 920 000 කි.

**18.** ධනුෂ්කගේ ව්‍යාපාරයේ 2021.03.20 එක දින ලකුණු කළ මිල රු. 4000 000 ක් වූ භාණ්ඩ 10% ක වට්ටම කට යටත්ව ණයට මිළ දී ගන්නා ලදී . මුල් සති දෙක තුළ පියවන වටිනාකමට 10% ක මුදල් වට්ටමක් ලබා දෙන බව ණය දුන් පාර්ශවය පවසයි

2021 . 03 .31 වන විට මුදලින් රු. 180 000 ක් ගෙවා ඇත. 2021.03.31 දිනට තවදුරටත් ගෙවිය යුතු වන්නේ ,

1) රු. 180 000 කි.
2) රු. 160 000 කි.
3) රු. 220 000 කි.
4) රු. 170 000 කි.
5) රු. 280 000 කි.

**19.** සී/ස සංක සමාගම VAT සඳහා ලියාපදිංචි සමාගමකි . 2021.04.01 දින අත්පත්කරගත් මුද්‍රණ යන්ත්‍රයේ තොරතුරු පහත දැක්වේ.

මුද්‍රණය යන්ත්‍රයේ ලකුණු කළ මිල රු. 1 800 000

| | |
|---|---|
| වැට් බදු ( VAT ) | රු. 180 000 |
| ගෙන ඒමේ රථපිරිවැය | රු. 90 000 |
| සවි කිරීමේ පිරිවැය | රු. 70 000 |

යන්ත්‍රයට අදාළ වැඩ බිම් සකස් කිරීමට අදාල වැයු වූ පිරිවැය රු. 60 000

ප්‍රථමයෙන් සිදුකළ පන් පරීක්ෂණ පිරිවැය රු. 100 000

- අත්පත් කරගන්නා ලද අවස්ථාවේදී 10 % ක වෙළෙඳ වට්ටමක් ලබා දී ඇත. මූලිකව සිදුකළ පරීක්ෂණයේදී නිෂ්පාදනය කරන අත ඒකක දෙසීයක් ( 200 ) රු. 600 බැගින් විකුණන ලදී.

LKAS 16 - දේපල පිරියත උපකරණ ප්‍රමිතය අනුව මූලික හඳුනාගැනීමේදී පිරිවැය වනුයේ ,

1) රු. 1 860 000 කි.
2) රු. 1 896 400 කි.
3) රු. 1 640 000 කි.
4) රු. 1 910 000 කි.

5) රු. 1 916 400 කි.

**20.** මූල්‍ය ප්‍රකාශන වල ණය ගැතියන් හා ණය හිමියන් හඳුනාගැනීම් සඳහා පහත කුමන ගිණුම් ගිණුම්කරණ සංකල්පය යොදා ගනී ද ?

1) උපලබ්ධි සංකල්පය
2) ගැලපුම් සංකල්පය
3) උපචිත සංකල්පය
4) ඒකක සංකල්පය
5) කාලච්ඡේද සංකල්පය

**21.** ශිරන්තිගේ ව්‍යාපාරයේ ආරම්භ වත්කම් වලට වඩා අවසාන වත්කම් රුපියල් ලක්ෂ 6 කින් ඉහළ ගොස් ඇත. කෙසේ නමුත් ආරම්භක වගකීම් වලට වඩා අවසාන වගකීම් පහල ගොස් ඇති බව ශිරන්ති ට අවබෝධ විය . ඒය රු150 000 කි. වර්ෂය අතරතුර තම වෙළෙඳ ප්‍රවර්ධන කටයුතුවලට අදාළව රු. 300 000 ක් අමතරව පෞද්ගලික මුදලක් ලෙස ව්‍යාපාරයට යෙදවූ ශිරන්ති තවත් රුපියල් 60,000ක තොගයක් ගැනිලි කර ඇත
ශිරන්තිගේ ව්‍යාපාරයේ වර්ෂයේ ශුද්ධ ලාභය හෝ අලාභය වනුයේ,

1) අලාභය රු. 900 00 කි.
2) ලාභය රු. 510 000කි.
3) ලාභය රු. 750 000 කි.
4) අලාභය රු. 510 000 කි.
5) ලාභය රු. 450 000 කි.

**22.** පොදු ජර්නලයේ වාර්තා කිරීමට තුඩුදෙන ගනුදෙනු වර්ග හතරක් දක්වන්න

1) ..........................
2) .........................
3) ..........................
4) ...........................
5) ............................

**23.** පහත ද අතුරෙන් මූල්‍ය ප්‍රකාශනවල සංරචකයක් නොවන්නේ

a) මූල්‍ය තත්ව ප්‍රකාශය
b) ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය
c) ගිණුම්කරණ සටහන් ප්‍රතිපත්ති
d) ණයගැති සැසඳුම් ලේඛනය
e) ලාභාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශයය

**24.** මූල්‍ය ප්‍රකාශන වල මූලික ගුණාත්මක ලක් ලක්ෂණ දෙක දක්වන්න

1) ...........................
2) ...........................

**25.** ව්‍යාපාරයක ඇල්මැති පාර්ශවයන් ගේ වයාපාරය කෙරෙහි ඇල්මක් දැක්වීමට හේතුන් / හේතුවන කරුණු පහත දක්වා ඇත . එම හේතුවෙන් වලට අදාල ඇල්මැති පාර්ශවයන් ගේ නිවැරදි අනුපිළිවෙලට තෝරන්න

A. අනාගත වර්ධනය සඳහා ගත් යුතු තීරණ සැලසුම් මොනවාද
B. ප්‍රතිඥාහාර ඉටුකිරීමට ව්‍යාපාරයට හොඳ පැවැත්මක් තිබේද
C. නියමිත පරිදි බදු ගෙවන්නේ ද
D. යෝජනයට සරිලන ප්‍රතිලාභයක් ලැබී තිබිය ද

1) අයිතිකරුවන්, රජය , කළමනාකරුවන්, සේවකයන්



JMC Learning
your virtual learning partner
Suranga sampath

2)අයිතිකරුවන් , කළමනාකරුවන්, ණයහිමියන් , කළමනාකරුවන්
3)කළමනාකරුවන්, ගනුදෙනුකරුවන්, අයිතිකරුවන් , මූල්‍ය ආයතන
4)කළමනාකරුවන් , ගනු ගනුදෙනුකරුවන්, රජය, අයිතිකරුවන්
5)රජය , කළමනාකරුවන්, ණයහිමියන් , ආයෝජකයන්

**26.** කළමණාකරන ගිණුම්කරණයට අදාළල ප්‍රකාශයක් නොවන්නේ ,

1) ඓතිහාසික හා පුරෝකථන තතන තොරතුරු යොදා ගනී
2) වාර්තා කරණ ආකෘතිය ගිණුම්කරණ ප්‍රමිත මගින් තීරණය කර ඇත .
3) ගිණුම්කරණ සංකල්ප නීති රීති හාරීති හා ගිණුම්කරණ ප්‍රමිත අදාල නොවේ.
4) කළමනාකරණයට අවශ්‍ය වන අවස්ථාවන්හි තොරතුරු ඉදිරිපත් කරයි.
5) අභ්‍යන්තර පාර්ශවයන්ට පමණක් තොරතුරු ඉදිරිපත් කරයි.

**27.** තොග ප්‍රමිතියයට අනුව , තොග වියදමක් ලෙස හඳුනා ගන්නා අවස්ථා දෙකක් දක්වන්න.

1) .........................................
2) ........................................
3) .......................................

**28.** මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හා ඉදිරිපත් කිරීමේ ආකෘතිමය අනුව ගිණුම්කරණ තොර තොරතුරු වල පැවති ගුණාත්මක ගති ලක්ෂණ මොනවා ද ?

1) අදාළ බව / විශ්වාසනීය බව /සංගතාවය / ප්‍රමාණාත්මක හව සරල බව /සැසඳිය හැකි බව
2) අවබෝධ කරගත හැකි බව /අදාළත්වය / විශ්වාසනීය නියෝජනය / සැසඳිය හැකි හව / සම්පූර්ණත්වය
3) අපක්ෂපාතී බව /ගිණුම්කරණ යථාර්ථය / අදාළත්වය / විශ්වාසනීය නියෝජනය / කාලීන බව ප්‍රමාණාත්මක බව
4) විශ්වාසනීය නියෝජනය /ගිණුම්කරණය යථාර්ථය/ ප්‍රමාණාත්මක බව /අපක්ෂපාතී බව /සංගතතාවය
5) විශ්වාසනීය නියෝජනය /සැසඳිය හැකි බව /පරීක්ෂා කළ හැකි බව/ අදාළත්වය /කාලානුරූප බව / අවබෝධ කරගත හැකි බව

**29.** පහත ප්‍රකාශයන්ගෙන් නිවැරදි ප්‍රකාශය කුමක්ද ?

1) 1995 අංක 15 දරණ ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත ට අනුව කළමනා කළමනාකරණ ගිණුම්කරණ කටයුතු සකස් කළ යුතුයි.
2) මූල්‍ය ගිණුම් ගිණුම්කරණයේ පදනම ලංකා ගිණුම්කරණ ප්‍රමිත වේ.
3) කළමණනාකරණ ගිණුම්කරණයේ අරමුණු වන්නේ ආයතනයේ විවිධ පාර්ශවයන්ට තොරතුරු සැපයීමයි.
4) සමාගම් වාර්ශික වාර්තා තුළ කළමනාකරණ ගිණුම්කරණයට අදාළ නිමවුම් ඇතුළත් කළ යුතුය.
5) කළමනාකරණ ගිණුම්කරණය මගින් අභ්‍යන්තර පාර්ශවයන්ට තොරතුරු සම්පාදනය කරයි

**30. මූල්‍ය ප්‍රකාශන පිලළියෙල කිරීමේ හා ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවේ පරමාර්ථ වන්නේ ,**

**a) ගිණුම්කරණ ප්‍රමිති සකස් කිරීමට අවශ්‍ය සහය ලබා දීම.**
**b) ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකසා ඇතිද යන්න , පිළිබඳ දව්ගණන මතයක් ප්‍රකාශ කිරීමට අවශ්‍ය සහාය ලබාදීම .**
**c) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා නිශ්චිත ආකෘතීන් අලුතින් හඳුන්වා දීම.**
**d) ගිණණුම්කරණ ප්‍රමිත මගින් ආවරණය නොවන කරුණු පිළිබඳව කටයුතු කිරීමට අවශ්‍ය මගපෙන්වීම ලබා දීම**

1) a සහ b පමණි

2) a , b සහ c පමණි
3) b , c හා d පමණි
4) a , b හා d පමණි
5) a, b , c හා d සියල්ලම

**31.** සමාගමක සුළු මුදල් සම්බන්ධ තොර තොරතුරු පහත පරිදි වේ. 2021.01.31 දිනට සුළු මුදල් භාරකරු සතුව පැවැති මුදල රු. 5 000
2021.02.01 ප්‍රධාන මුදල් භාරකරු විසින් සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීමට රුපියල් 7000 ක මුදලක් සුළු මුදල් භාරකරුට ලබා දෙන ලදී.
2021.02.28 පැවැති මුදල රුපියල් 4000 කි
2021.03.01 දින ප්‍රධාන මුදල් භාරකරු විසින් සුළු මුදල් භාරකරුට ප්‍රතිපූර්ණය කළ යුතු මුදල වන්නේ,

1) රු. 7000 කි.
2) රු. 8 000 කි.
3) රු. 9 000 කි.
4) රු. 6 000 කි.
5) රු. 5 500 කි.

JMC Learning "your virtual learning partner" Suranga sampath